පසුගිය දිනක හැටන් හිදී පුද්ගලයකු විසින් දිවි අහිමි කර ගැනීමට කළ තැතක් පිළිබඳව මාධ්‍ය තුළ කරුණු වාර්තා වී තිබිණි. කෙසේ වෙතත් මෙම පුවත් වාර්තාවන්හි දිවි අහිමි කර ගැනීම් වාර්තාකරණය හා සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්මයන් ආචාර ධර්මයන් උල්ලංඝනය වී තිබෙනු ද දක්නට ලැබිණි.

දිවි අහිමි කර ගැනීම් හෝ ඊට තැත් කිරීම් වාර්තා කිරීමේදී අදාළ මාධ්‍ය ආචාර ධර්මයන් පිළිපදින ලෙසත්, විශේෂ ප්‍රවේසමකින් කරුණු වාර්තා කරන මාධ්‍යවේදීන්ව දිරිමත් කරන්නේ, තවත් අයෙකු වක්‍රාකාරයෙන් දිවි අහිමි කර ගැනීමට පෙළඹීමේ හැකියාව අවම කිරීමටයි.

එසේම දිවි අහිමි කරගත් හෝ ඊට තැත් කළ අයෙකුගේ ඡායාරූප ආදිය පළ නොකරන ලෙසින් එම මාධ්‍ය ආචාර ධර්මයහි දැක්වෙන්නේ, ඒ ඔස්සේ පවුලේ අයට හෝ එම තැනැත්තාට ඇතිවන සිත් වේදනාවන්, ගැටලුකාරී තත්වයන් තත්ත්වයන් අවම කිරීමටයි.

එසේම උපකාරක අංකයන් පල කිරීම ඔස්සේ, දිවි අහිමි කර ගැනීමේ නැඹුරුතාවක් ඇත්තෙකුගේ ජීවිතය බේරා ගැනීමට ඉඩක් ලැබෙනු ඇත.

**#MediaEthicsSL** **#lka** **#SinhalaPress** **#Dinamina** **#Divaina** **#Mawbima** **#Aruna**

See Less